ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1791/30 - 2013 ජනවාරි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2013.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

15(1) වැනි වගන්තිය යටතේ නියෝගය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15(1) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමයෙන් මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති, මාතර මහ නගර සභාවට අයත් ඉඩම, 2012.12.31 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරමි.

මහින්ද රාජපක්ෂ,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 31 වැනි දින,
"සෙත්සිරිපාය", බත්තරමුල්ල,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර මහ නගර සභා සීමාව තුළ, උයන්වත්ත දකුණු, කොට්ඨාස අංක 4 තුළ පිහිටියාවූ ද, මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන පිළියෙල කරන ලද අංක එම්ආර්/එම්ටීආර්/2012/147 හා 2012.07.14 දිනැති අනුරේඛණයේ කැබලි අංක ඒ, බී හා සී වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.5470 ක් (අක්. 3 රූඩ් 3 පර්. 11.45) විශාල වූ, වරිපනම් අංක 1615 දරන ඉඩම,

ඉඩමේ මායිම් පහත දැක්වේ.

1. කැබලි අංකය : ඒ
   ඉඩමේ නම : වරිපනම් අංක 1615 හි කොටසක්
   ප්‍රමාණය : හෙක්ටයාර් 0.7606

   උතුරට : මාතර රජයේ මහ රෝහල් පරිශ්‍රය සහ පිඹුරේ කැබලි අංක බී සහ සී ;
   නැගෙනහිරට : පිඹුරේ කැබලි අංක බී සහ ඇළ ;
   දකුණට : නිල්වලා ගඟ ;
   බටහිරට : මාතර සිට ගාල්ල දක්වා මහා මාර්ගය (මා.සං.අ.).

| | | |
|---|---|---|
| 2. කැබලි අංකය | : | බී |
| ඉඩමේ නම | : | වරිපනම් අංක 1615 හි කොටසක් |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.6921 |
| උතුරට | : | මාතර රජයේ මහ රෝහල් පරිශ්‍රය ; |
| නැගෙනහිරට | : | ඇළ ; |
| දකුණට | : | පිඹුරේ කැබලි අංක ඒ සහ සී ; |
| බටහිරට | : | පිඹුරේ කැබලි අංක ඒ. |

| | | |
|---|---|---|
| 3. කැබලි අංකය | : | සී |
| ඉඩමේ නම | : | වරිපනම් අංක 1615 හි කොටසක් |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.0943 |
| උතුරට | : | පිඹුරේ කැබලි අංක බී ; |
| නැගෙනහිරට | : | පිඹුරේ කැබලි අංක බී ; |
| දකුණට | : | පිඹුරේ කැබලි අංක ඒ ; |
| බටහිරට | : | පිඹුරේ කැබලි අංක බී. |

01 - 502

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.